ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2008

023

**ESP 1263** - විෂයමාලාව හා ඇගයීම

කාලය - පැය තුනයි.

---

දිනය - 2008.05.25 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30 දක්වා

---

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
එක් එක් පිළිතුර සඳහා වෙනම පිළිතුරු පත්‍ර භාවිතා කරන්න.

01. (i) තර් ඉදිරිපත් කොට ඇති 'විෂයමාලා' නිර්වචනය දක්වන්න. (ලකුණු 08)

(ii) ඔහු නිර්මාණය කල විෂයමාලා ආකෘතිය කෙරෙහි බලපා ඇති සමාජයීය හා සංස්කෘතික සාධකවල වැදගත්කම ගැන අදහස් දක්වන්න. (ලකුණු 10)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රාථමික හෝ කණිෂ්ඨ ද්විතීයික තලයේ විෂයමාලාව තෝරා පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

අ) ඔබ තෝරාගත් විෂයමාලාව ගොඩ නැගීමේදී තර්ගේ ආකෘතිය කෙතෙක් දුර යොදාගෙන තිබේ ද?

ආ) ඉගැන්වීම හා ඉගෙනීමේ ක්‍රියාවලියේ ඵලදායීතාවය වර්ධනය කිරීමට විෂයමාලාව කෙසේ දියුණු කල හැකි ද ?

(ලකුණු 15)

02. (i) විෂයමාලා සංවිධානය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) විෂයමාලාව සංවිධානය කිරීමේදී සැලකිය යුතු මූලධර්ම හතරක් (4) දක්වන්න.

(ලකුණු 08)

(iii) මින් මූලධර්ම දෙකක් (2) තෝරා, එම මූලධර්ම ගැන විෂයමාලා සංවිධානයේදී සැලකිලිමත්වීම අවශ්‍ය කුමක් හෙයින් දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iv) සුවිශේෂ ඉලක්ක කණ්ඩායමක් සඳහා විෂයමාලාවක් සංවර්ධනය කරන අයෙකුට මුහුණදීමට සිදුවිය හැකි ගැටළු හඳුනා ගන්න.
එවැනි ගැටළු විසඳා ගැනීමට විෂයමාලා සංවර්ධනකරුට ඔබට දීමට ඇති උපදෙස් කවරේද ?

(ලකුණු 12)

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

03. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ පූර්ව -සේවා ප්‍රාථමික තලයේ විෂයමාලාවේ ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් දක්වන්න. (ලකුණු 08)

(ii) හඳුනාගත් අරමුණු සඵල කර ගැනීමට විෂයමාලා ප්‍රබලතා හා දුබලතා කෙටියෙන් පහදන්න. (ලකුණු 12)

(iii) ඔබ හඳුනාගත් එම දුබලතා ජය ගැනීමට ගතයුතු පියවර සාකච්ඡා කරන්න. (ලකුණු 13)

04. (i) ගුරු අධ්‍යාපන විෂයමාලාවක් ඇගැයීම අවශ්‍ය කුමක් හෙයින්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) විෂයමාලා ඇගැයීමේ ක්‍රියාවලියේදී කවර පැති විභාග කෙරේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 09)

(iii) විෂයමාලා ඇගැයීමේදී භාවිතා කරන උපකරණ හා ක්‍රියා පිළිවෙල කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 09)

(iv) එම උපකරණ හා ක්‍රියා පිළිවෙලෙහි සඵලතාවය ගැන සාකච්ඡා කරන්න. (ලකුණු 09)

05. (i) ගුරුවරුන් හා ගුරු අධ්‍යාපනඥයින් ඇගැයීම සඳහා භාවිතා වන ක්‍රමවේද (4) හතරක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(ii) ඔබ ඉතා ඵලදායී ලෙස සලකන ඉහත සඳහන් එක් (01) ක්‍රමයක් තෝරා, එය එසේ තෝරා ගැනීම සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

(iii) ඇගැයීමට ලක්වීම නිසා (ගුරුවරුන්ට) (ආ) ගුරු අධ්‍යාපනඥයින්ට අයත්වන ප්‍රතිලාභ කවරේදැයි විභාග කරන්න. (ලකුණු 15)

06. පහත සඳහන් කරුණු (03) තුනක් ගැන කෙටි සටහන් ලියන්න.

(i) ගුරු අධ්‍යාපනඥයකුගේ අධීක්ෂණ භූමිකාව
(ii) සිසුන්ගේ පරීක්ෂණ ප්‍රතිඵල වාර්තාකරණය හා විශ්ලේෂණය
(iii) විෂයමාලා වෙනස්වීම් කළමනාකරණය
(iv) පාසල් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පති භූමිකාව
(v) විෂයමාලා න්‍යායක වැදගත්කම

(ලකුණු 11 x 3 යි)
(ලකුණු 33 x 3 + 1 = 100)

- හිමිකම් ඇවිරිණි. -